ලැබිණ. වෙනදා හිමිදිරි පාන්දරට ඇසෙන කපුටන්ගේ සහ වෙනත් කුරුල්ලන්ගේ නාද ද ඇසෙන්නට විය.

එදින මෙම නිරීක්ෂණය සඳහාම පැමිණ සිටි විද්‍යාගාර සහායක ඒකනායක අය්යා මිදුලේ කොණක තණකොළ ගොල්ලට ගොස් ඔහු අත තිබුණු විදුලි පන්දම දල්වා යම්කිසි නිරීක්ෂණයක් කර,

"මෙන්න සර්....., තවත් එකක්. මෙතැන තිබෙන නිදිකුම්බා පැලයකුත් කොළ පහත් කර ගෙන නිදි"
එයද වැදගත් බව කී විදුහල්පති තුමා කවුරුත් එක් එක්කෙනා ගිහින් ඒකත් බලන්න කියා අපට උපදෙස් දුන්නේය.

අපි එම ස්වාභාවික සංසිද්ධියද පියවි ඇසින්ම දැක ගතිමු.
දැන් සූර්යයා ක්‍රමක්‍රමයෙන් වැසී යනු අපට විස්මිත කන්නාඩිය හරහා පෙනේ. කාටත් බියමුසු වුවත්, අමුතුම ආස්වාදයක් දැනෙන්නට විය. අපගේ සමහර සගයින් මහත් තැතිගත් ස්වභාවයක් පෙන්වූහ.

මිනිත්තු හතරකදී පමණ සූර්යයා සම්පූර්ණයෙන්ම වැසී ගියේය. තත්පර කිහිපයකදී ඝනාන්ධකාරය දසත පැතිරිණ. මෙය සිත සසල කරන මහත් බියකරු දසුනක් විය .

ස්වාභාවික සංසිද්ධි තුනක් සම්පූර්ණ විය යුතුය.

- පළමුව චන්ද්‍රයා අමාවක තත්ත්වයේ තිබීම,
- දෙවනුව චන්ද්‍රයා පෘථිවිය භ්‍රමණය වන පථය හරහා ගමන් කිරීම
- තුන්වෙනුව චන්ද්‍රයාගේ පථයේ පිහිටන ස්ථානය සූර්යයාගේ ගමන් පථයට ආසන්නවම පිහිටින ස්ථානය වීම.

■ මෙසේ සිදුවන විට සූර්යයා, චන්ද්‍රයා සහ පෘථිවිය, එක් රේඛාවක පිහිටන පථයේ චන්ද්‍රයා මැදින් සිටී .

■ පෘථිවියේ සිට ග්‍රහණය නිරීක්ෂණය කරන අයෙකු මෙම පථය ඇතුළත සිටිනම් ඔහුට පූර්ණ සූර්ය ග්‍රහණයක් දකින්නට ලැබේ.
■ චන්ද්‍රයා පෘථිවිය වටා භ්‍රමණය වනුයේ දින 29.5 කට වරකි.
■ එහෙත් ග්‍රහණ සිදුවීම සඳහා අවශ්‍ය නිර්ණායක සියල්ල සම්පූර්ණවී පූර්ණ ග්‍රහණයක් සිදුවනුයේ ඉතා කලාතුරකිනි.

■ 1955 ජූනි 20 දින සිදුවූ පූර්ණ සූර්ය ග්‍රහණය 11 වන ශත වර්ෂයේ සිට 22 වන ශත වර්ෂය දක්වා වසර 1200 ක පමණ කාල සීමාව තුළදී සිදුවන දීර්ඝතම

පතිත කරවා ගත හැකිය. ජල බේසමක ජලයෙහි හටගන්නා ඡායව බැලීම ඇස් වලට අහිතකර නොවේ.

1955 සූර්ය ග්‍රහණයත් සමග අපේ කාන්තාවන් බොහෝ දෙනෙකු සිරුර පැහැපත් වීම සඳහාත්, තාරුණ්‍යය වර්ධනය කර ගැනීම සඳහාත් මේ අවස්ථාවේදී වදකහ කෂාය බීම නිසා මහත් කරදර වලට මුහුණ පෑහ. වදකහ

සියලුම ආරෝග්‍යශාලා අධික ලෙස බඩ විරේකයෙන් සහ වමනයෙන් පිඩා විඳින කාන්තාවන්ගෙන් පිරී ඉතිරී යන්නට විය. මෙය රටෙහි මහත් ආන්දෝලනාත්මක සිද්ධියක් විය. ඊටපසු දිනපතාම වාගේ, අධික විරේකය නිසා තදබල ලෙස ඔත්පලවූ කාන්තාවන් ගැනද අසන්නට ලැබුණි. ඒ බොහෝ දෙනෙක් හොර රහසේම කුට වෙළඳුන්ගෙන් ලබාගත් වදකහ කෂාය බී




පූර්ණ සූර්යග්‍රහණය ඉතා හොඳින් දිස්වූ පථය

කෂාය පිලිබඳ වැඩි ප්‍රසිද්ධියක් නොතිබුණනත් ගොඩ වෙදුන්ගේ සහ කුට ජෝතිශ්ශාස්ත්‍රඥන්ගේ ප්‍රචාර ආරංචි මාත්‍රයෙන් හෝ දැනගත් සමහර කාන්තාවන්, පූර්ණ සූර්ය ග්‍රහණය පවතින වේලාවේදී වදකහ කෂාය බී තිබේ. මෙය කුඩු වශයෙන් විකිනීමට සකස් කර තිබුණු බව පසුව දැනගන්නට ලැබිණ. සමහරවිට වදකහ වලින් අධික ලෙස බඩ විරේක වීම සහ වමනය යාම සිදුවන බව ඔවුන් නොදැන සිටින්නට ඇත. එදින දහවල් වන විට රටෙහි

සිරුර පැහැපත් වීම කෙසේ වෙතත් කාගේත් සමච්චලයට ලක්විය.

ඒ දිනවල කවි කොළ, කවි පොත්, පත්‍ර වාර්තා, ගී, සින්දු, බයිලා, කාටූන් චිත්‍ර ආදියටද "වදකහ සුදිය" හාස්‍ය ජනක මාතෘකාවක් විය.

මෙහි සමහර තොරතුරු ස්තූති පූර්වකව, අන්තර් ජාලයෙනි




පූර්ණ සූර්යග්‍රහණය සිදුවන ආකාරය

"රාහු ඉර ගිලලා වැමෑරුවේ නැත්නම් ලෝකයට වෙන්නේ මොකක්ද?"
බියට පත් අපේ ලාබාල නේවාසිකයෙකු ප්‍රශ්න කළ විට එය බොහෝ දෙනෙකුගේ සිනහවට කරුණක් විය.

"පසක් රාහු මුව පත් වෙමිනි බියකර අතික් පසින් ලොව හෙළි කෙරෙය හිමකර"
යන සුභාෂිතයේ හඳ රාහු ඇල්ලීම ගැන ඇති කවිය මට සිහි විය.

පූර්ණ සූර්යග්‍රහණය අවසන් වූ පසු නැවත අඳුරු ගතිය ක්‍රමයෙන් පහවන්නට විය. පෙරවරු දහය පමණ වන විට සියල්ලම යථා තත්ත්වයට පත්විය.

විදුහල්පතිතුමාගේ දැනුම සහ යහපත් දැක්ම නිසා අප සියලු දෙනාටම ඉතාමත් කලාතුරකින් දකින්නට ලැබෙන පූර්ණ සූර්යග්‍රහණය කිහිප ආකාරයකින් රිසිසේ දැක බලා ගැනීමට හැකිවිය. එවැනි විදුහල්පති වරයෙකු ලැබීම අපගේ මහත් භාග්‍යයකි.

**සූර්යග්‍රහණ පිළිබඳ තවත් විද්‍යාත්මක තොරතුරු බිඳක් මෙහිලා සටහන් කිරීම උචිත යයි සිතුවෙමි.**

■ තුන් ආකාරයක සූර්යග්‍රහණ සිදුවේ.
■ ඒවා නම් පූර්ණ, අර්ධ සහ වලයාකාර ග්‍රහණයි.
■ පූර්ණ සූර්ය ග්‍රහණයකදී සූර්යයා සම්පූර්ණයෙන්ම වැසී යයි
■ අර්ධ ග්‍රහණයයකදී එක් කොටසක් පමණක් වැසෙයි.
■ වලයාකාර ග්‍රහණයකදී සූර්යයාගේ පරිධියේ වළල්ලක් වැනි රවුමක් නොවැසී දීප්තිමත්ව පවතී.
■ පූර්ණ සූර්ය ග්‍රහණයක් සිදුවීම සඳහා

වේලාවක් පවතින පූර්ණ සූර්ය ග්‍රහණයයි. එහි උපරිම කාල සීමාව මිනිත්තු 7 තත්පර 8 ක් විය .

■ මෙම පූර්ණ සූර්ය ග්‍රහණයේ ඉතාමත් පැහැදිලි පථය ඉන්දියන් සාගරයේ මාලදිවයින් අසලින් ආරම්භවී ශ්‍රී ලංකාව ඔස්සේ තායිලන්තය හරහා පිලිපීනය සහ සොලමන් දූපත් පසුකර පැසිපික් සාගරයේදී අවසන් වී තිබේ.
■ ශ්‍රී ලංකාව තුළ පූර්ණ සූර්යග්‍රහණය පවතින තීරුව 250 නප (සැතපුම් 158 ක පමණ පළලින් යුක්ත විය.
■ ශ්‍රී ලංකාවේ හිඟුරක්ගොඩ ප්‍රදේශයට මෙම පූර්ණ සූර්ය ග්‍රහණය ඉතාමත් පැහැදිලිව දර්ශනය වන බව ගණනය කර තිබුණි.
■ ලෝකයේ විවිධ රටවල අභ්‍යවකාශ විද්‍යාඥයින් සියගණනක් සමග ලාංකික විද්‍යාඥයින්ද එකතුවී මෙම පූර්ණ සූර්ය ග්‍රහණය පිලිබඳ විද්‍යාත්මක දත්ත රැස් කිරීමට යුහුසුළු වූහ.

කුමන ආකාරයේ සූර්ය ග්‍රහණයක් වුවත් පියවි ඇසින් නිරීක්ෂණය කිරීම ඇස් වලට හානිකරය. ඇසෙහි කණිනිකාව (cornea) නම් මතුපිට සියුම් පටලය සූර්ය විකිරණය මගින් හානිවී ඇස් අන්ධ විය හැකිය. සූර්ය ග්‍රහණයක් දුරේක්ෂයක් (telescope) හෝ දෙනෙතියකින් (Binoculars) වුවද කෙලින්ම බැලීම හානිකරය. කැමරාවකින්, දුරේක්ෂයක් හෝ දෙනෙතියකින් ලබාගන්නා ඡායව තිරයක් මත පතිත කරවා බැලීම සුදුසුම ක්‍රමයයි. පහසුවෙන් සකස් කර ගත හැකි සුචි සිදුරු කැමරාවකින් (Pinhole camera) ලබාගත හැකි ඡායව වුවද තිරයක් මත

